Healthcare Immigration Academy

# පුවත්ලිපිය

ප්‍රගතිශීලී සෞඛ්‍ය සේවා වෘත්තීයවේදියන් හට ලොව දිනන්නට

පළමු කලාපය | ජූනි 2023

විශේෂ නිවේදනයයි!



## ජූනි මස එළිදැක්වීම්

එක්සත් රාජධානියට ප්‍රවේශවීමට පිණිස අප ආයතනය ජූනි මස තුළ නව මංපෙත් දෙකක් අපගේ හෙද සිසු සිසුවියන් හට ලගා කර දුන්නෙමු. එයින් පළමුවැන්න අධ්‍යාපනික කටයුතු හැදෑරීම ඔස්සේ හෙද හෙදියන්ට සංක්‍රමණ ප්‍රවේශ හඳුන්වා දුන්නෙමු. එයට අමතරව අපගේ සිසු සිසුවියන්ට ජූනි මස පුරාවට ම විවිධ වූ ආකාරයේ සෞඛ්‍ය/සමාජ සත්කාර (Caregiver) වරම් ලබා දීම දියත් කළෙමු. මෙම ද්විත්ව මංපෙත් ඔස්සේ එක්සත් රාජධානියට සංක්‍රමණය වීමට අවශ්‍ය සියලු උපදෙස් යොමුකිරීම් නිපුණතා ඇගයීම් නොමිලේ උදාකර දුන්නෙමු.

තවද මෙම මාසයේදී සෞඛය ක්ෂේත්‍රයේ දැඩි ඌනතාවයක් ලෙස සැලකෙන ඉංග්‍රීසි කුසලතාවයන් හි අඩුපාඩුව මග හැරලීමට පිණිස විවිධ ආකාරයේ ඉංග්‍රීසි වැඩසටහන් පාඨමාලා හඳුන්වා දුන්නෙමු. මූලාරම්භක ඉංග්‍රීසි කතා පුහුණු පාඨමාලා/ඉංග්‍රීසි භාෂා නීතිරීති දැනුම/ අවබෝධය හා ශබ්දමාලා භාවිතය සම්බන්ධව වැඩසටහන්ද සන්නිවේදන ක්‍රමවේද ඔප් නැංවීම පිණිස වැඩසටහන්ද අප දියත් කළෙමු. එහි විශේෂ ප්‍රතිඵලයක් ලෙස ලොව ප්‍රමුඛ Cambridge ආයතනය මගින් ඉදිරිපත් වන වැඩසටහන් කීපයක්ම ඔබ වෙත ළඟා කිරීමට බලාපොරොත්තු වන්නෙමු.

UK READY NURSE

## ඔබ මනෝ චිකිත්සක හෝ මානසික හෙද හෙදියක්ද? එහෙනම් මෙම අවස්ථාව ඔබ සඳහාමයි.

මනෝචිකිත්සක හෙද හෙදියන් සඳහාම අති විශේෂ වරප්‍රසාදයක් ලෙස ජූනි මස තිස් වන දා දක්වා UK-Ready Nurse වැඩසටහන සමඟ සම්බන්ධ වන සියලුම මනෝචිකිත්සක හෙද හෙදියන් උදෙසා ඔවුන්ගේ ඉංග්‍රීසි කුසලතා සඳහා කැප කරන සියලූ පිරිවැය (අධ්‍යාපන කටයුතු හා විභාග ගාස්තු) සාර්ථක සමත් වීම ඔස්සේ ප්‍රතිපූර්ණය කර ගැනීමේ හැකියාව අපි උදා කර දෙන්නෙමු.

වැඩි විස්තර සඳහා: 24/6/2023 අපගේ Facebook වීඩියෝ සටහන බලන්න

### පෙර කිසිදා නොවූ අවස්ථාවක්*

**මනෝචිකිත්සක / මානසික සෞඛ්‍ය හෙද/හෙදියන් වෙනුවෙන්,**

**UK-Ready Nurse** වැඩසටහනට සම්බන්ධවී
**NHS (UK) TRUST** වරම් ලද විට ඔබේ සම්පූර්ණ ඉංග්‍රීසි පුහුණු පිරිවැය සහ විභාග ගාස්තු ආපසු ගෙවනු ලැබේ!

මනෝචිකිත්සක/මානසික සෞඛ්‍ය හෙද/හෙදියන් හට ලැබෙන විශේෂ වරම්

- සාමාන්‍යයෙන් මාස 4ක් ඇතුළත වේගවත් ආගමන මාර්ගය
- OSCE අවසන් වූ පසු බෑන්ඩ් 5 වැටුප් වැඩි කිරීම
- NHS විශිෂ්ට වෘත්තීය ප්‍රගතියක්

### හෙද හෙදි ඔබ සඳහාම එක්සත් රාජධානියට සංක්‍රමණය කිරිමට විවිධ වූ මංපෙත් හදුන්වාදෙනු ලැබේ.

- සෞඛ්‍ය සේවා අධ්‍යාපන/වෘත්තිය පුහුණු ධාරාවන්
- පෞද්ගලික අංශයේ සායනික වෘත්තිය මංපෙත්
- NHS TRUST සඳහා අවශ්‍ය පහල තලයේ සායනික සෞඛ්‍ය වෘත්තීය අවස්ථා
- සමාජ සේවා/සෞඛ්‍ය සත්කාර ක්ෂේත්‍රයේ වරම්

## එක්සත් රාජධානියට සංක්‍රමණ මාර්ග

අපගේ වැඩසටහන හදාරන්නන්ගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් අපි ජූනි මාසයේදී විකල්ප මාර්ග වැඩසටහන් දියත් කළෙමු.

මෙම වැඩසටහන් එක්සත් රාජධානියට සංක්‍රමණය වීමට බොහෝ මාර්ග සපයයි. එක්සත් රාජධානියේ සෞඛ්‍ය වෘත්තිකයන් සඳහා විවිධ ආකර්ෂණීය අවස්ථා තිබේ. අපගේ බොහෝ සිසුන් ලියාපදිංචි හෙදියන් ලෙස එක්සත් රාජධානියට සංක්‍රමණය වීමට කැමැත්තක් දක්වයි. වෙනත් සායනික නොවන ශාස්ත්‍රීය/වෘත්තීය භූමිකාවන් සඳහා එක්සත් රාජධානියට යාමට කැමති තවත් අය සිටිති.
මේ වැඩසටහන එවැනි අය සඳහායි.

ඔබ වෛද්‍යවරයෙක් හෝ හෙද/සෙසු සෞඛ්‍ය වෘත්තිකයෙක් (AHP) නම් මෙම මාර්ග පිළිබඳව තොරතුරු දැන් අපෙන් ලබා ගත හැක.

දැන් ඔබට එක්සත් රාජධානියේ ඔබේ සිහින සැබෑ කර ගැනීම සඳහා අපගේ මග පෙන්වීම සහ වෘත්තීය සේවාවන් ලබා ගත හැක.

මෙම සෑම මාර්ගයකටම තමන්ගේම සුදුසුකම්, තේරීම් නිර්ණායක සහ වෙනත් අවශ්‍යතා ඇත. මෙම විකල්ප අනුගමනය කිරීමට ඔබ සුදුසුකම් ලැබිය යුතුය. අපගේ සමාගම ඔබට අවශ්‍ය මට්ටමට ගැලපෙන පරිදි පුළුල් සේවාවන් සපයයි. ඔබ කැමති මාර්ගය පිළිබඳව අපගෙන් උපදෙස් ලබා ගැනීමෙන් ඔබගේ මංපෙත් විවර කරගන්න.

# කුසලතා පරිපූරණය උදෙසා අපගේ තවත් මෙහෙයවරක්



මෙම ප්‍රකාශනයේ පළමු එළිදැක්වීම මහත් සාඩම්බරයෙන් ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු. මාසිකව එළි දැක්වෙන මෙම ප්‍රකාශනය ඔස්සේ සංක්‍රමණය උදෙසා අවශ්‍ය වන අධ්‍යාපන සුදුසුකම් හැකියාවන් හා නිපුණතාවයන්, පිළිගත/අනුගත විය යුතු ක්‍රියා පටිපාටියක් එක්සත් රාජධානියට හා වෙනත් රටවල් වලට අනුකූලව ඔබ වෙත ගෙන ඒම අපගේ අභිප්‍රායයි.

එය ඔස්සේ අපගේ ආයතනයේ විවිධ වූ වැඩසටහන් ද ඒවායේ ප්‍රතිලාභ ද නිසැකවම ඔබට දැනගත හැකිය. එමෙන්ම මෙහි සපයා ඇති තොරතුරු සියල්ල නිල විධිමත් මූලාශ්‍ර තුළින් ලබාගෙන ඇති අතර එහි නිරවද්‍යතාවය උදෙසා එම මූලාශ්‍ර ද සටහන් කොට ඇත්තෙමු. සෑම මසකම එළිදැක්වෙන මෙම ප්‍රකාශනය ඔස්සේ ඔබට ඉතාමත් වැදගත් අප ආයතනය වැඩසටහන්ද ලොව පුරා විවිධ රටවල උදාවෙන රැකියා සහ සංක්‍රමණික වරම් ද ඒ ඒ රටවල සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි නව ප්‍රවණතා ද ගෙන හැර දැක්වීමට අප බලාපොරොත්තු වෙමු.

ඔබගේ වෘත්තීමය ජයග්‍රහණය සඳහා අප ආයතනය කැපවී සිටින අතර එම සියළු ප්‍රතිලාභ දැනගැනීමට මෙම ප්‍රකාශනය උපයෝගී කර ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. යම්කිසි විශේෂ කරුණු ඔබ දැන ගැනීමට අවශ්‍ය නම් අප හා සම්බන්ධ වන්න.

අපගේ නව කාර්යාලය ජූනි මස සිට 31, ඩබ්. ඒ. ඩි. රාමනායක මාවත, කොළඹ 02 හි ස්ථානගත කර ඇති අතර එමගින් අපගේ සිසු සිසුවියන් හට වඩාත් ඵලදායී වූත් අර්ථවත් වූත් සේවා සමූහයක් හඳුන්වා දීමට බලාපොරොත්තු වෙමු. සෑම සිකුරාදා දිනයක්ම මහජන සම්බන්දතා දිනයක් ලෙස වෙන් කොට ඇති අතර අප ආයතනයට පැමිණ සියලු කරුණු විමසා දැනගැනීමට ඔබ හට අප ආරාධනා කරමු.

දුර්ෂියා පෙරේරා
සන්නිවේදන නිළධාරිනි
හෙල්ත්කෙයාර් ඉමිග්‍රේෂන් ඇකඩමි

# සැමට ඉංග්‍රීසි

ශ්‍රී ලංකාවේ බොහෝ සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට එක්සත් රාජධානියට සහ අනෙකුත් සියලුම රටවලට අවශ්‍ය ඉංග්‍රීසි ප්‍රවීණතා මට්ටම් නොමැතිකම යන ගැටලුව විසදා දීමට අප ඉදිරිපත් වී ඇත්තෙමු. අපි දැන් ඔබට ඔබේ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා පුළුල් ඉංග්‍රීසි පුහුණු සේවා සමූහයක් ලබා දෙන්නෙමු.

ඔබ අප හා සම්බන්ධවී ඔබගේ ඉංගිසි මට්ටම අගැයීමට ලක් කරගන්නා ලෙස අපි නිර්දේශ කරමු. ඔබගේ වර්තමාන කුසලතා මොනවාද සහ අපේක්ෂිත වැඩිදියුණු කිරීම් සඳහා කුමක් කළ යුතුද යන්න පිළිබඳව මෙය ඔබට නිවැරදි අවබෝධයක්, කතා පුහුණුව, ආයතනයන් සඳහා කෙම්බ්‍රිඩ්ජ් ඇගයීම් සේවා ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු.

දැන් අපි මූලික අත්‍යවශ්‍ය ඉංග්‍රීසි කතා කිරීම, වචන මාලාව සහ ව්‍යාකරණ, ආයතනික සඳහා ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා, කේම්බ්‍රිජ් ඉංග්‍රීසි මට්ටම් අගැයිම් මගින් ඔබට හඳුන්වා දෙන්නෙමු.




# සංවාද කුලසතා වැඩටසටහන

අප **Dynamic Dialogue** සංවාද කුලසතා පුහුණු වැඩටසටහනේ සැසි දෙකක් ජුනි මස සංවිධානය කලෙමු. ඵලදායී සන්නිවේදන කුසලතා ඔප්නැංවීම මෙහි අරමුණයි. මෙම වැඩසටහන මෙහෙයවනු ලබන්නේ පළපුරුදු හඬ පුහුණුකරුවෙකු සහ උපදේශකයෙකු වන ප්‍රතාප් රාම්ක්‍රිෂ්ණන් මහතා විසිනි.

මෙම වැඩසටහනට සහභාගිවන්නන්ට වඩා හොඳ සන්නිවේදනයක් සඳහා අත්‍යවශ්‍ය කරුණු හඳුන්වාදෙනු ලැබේ. මෙම වැඩසටහන වාචික ගුණාංග, අත් අභිනයන්, ශාරීරික ඉරියව් සාර්ථක සන්නිවේදනයකට යොදා ගන්නා අයුරු පිළිබඳ අවධාරණය කරයි. ඉතා විධිමත් ආකාරයෙන් පුහුණුව ලබා දෙන අතර, සහභාගිවන්නන්ට කුසලතාවය හා හැකියාවන් වැඩිදියුණු කිරීමට බොහෝ පුහුණු අවස්ථා ලැබේ. මෙම වැඩසටහනේදී ඉගෙන ගන්නා කුසලතා විවිධ අවස්ථා වලදී පහසුවෙන් භාවිතා කළ හැකිය. පාරිභෝගික සේවා නිලධාරීන්, කණ්ඩායම් නායකයින් සහ විධායක නිලධාරීන් සහ ඔවුන්ගේ එදිනෙදා වැඩ සඳහා ප්‍රයෝජන ගත හැකි වැදගත් කරුණු ඉගෙන ගත හැක.








**Dynamic Dialogue** වැඩසටහන නැවත වතාවක් සාර්ථකව ඉදිරිපත් කළෙමු. පෞද්ගලික ආයතන රැසක නිලධාරීන් උදෙසා පැවැත්වූ මෙම පුහුණු වාරය අප වෙත ඉතා හොඳ ප්‍රතිචාර ලැබී ඇත. ඉහත ඡායාරූපය වැඩසටහන මෙහෙයවන ප්‍රතාප් රාමක්‍රිෂ්ණ මහතා සමඟ වැඩසටහනට සම්බන්ධ වූ නිලධාරීන් පෙන්නුම් කෙරේ.




## ඔබ නිවැරදි තේරීම කර තිබේද?

දොස්තර හෙද/හෙදි සහ සෙසු සෞඛ්‍ය නිලධාරීන් බොහෝ දෙනෙකු මෙම විභාග දෙකෙහි වෙනස හරිහැටි හඳුනා ගත නොහැකිව අප වෙත ප්‍රශ්න යොමු කරනු ලැබේ. ඒ එක් එක් පුද්ගලයාගේ අවශ්‍යතාවය මත උචිත වූත් නිවැරදිවූත් විභාගය තෝරාගැනීමෙන් කාලය, ශ්‍රමය, මුදල් සහ අනාගත අභිප්‍රායයන් නිසිලෙස හසුරවා ගත හැකිය. IELTS සහ OET යන විභාග දෙකම ඉතා උසස් මට්ටමින් යුත් ඉංග්‍රීසි කුසලතා ඇගයීම සඳහා භාවිතා වන මුළු ලොවම පිළිගත් විභාගයන් වේ. ලොව බොහොමයක් සෞඛ්‍ය මණ්ඩල, රජයන් හා බැඳී ආයතන මෙම විභාගයන් මගින් සිදුකරන ඇගයීම් ස්ථිරසාර පිළිගැනීමකට භාජනය කරනු ලැබේ. එසේ නමුත් පහත සඳහන් කරුණු ඔබගේ වැඩි අවධානය සඳහා අපි ඉදිරිපත් කරමු.

1. ඉංග්‍රීසි දැනුම සහ භාවිතා හැකියාව යන අංග දෙයාකාර වේ. දැනුමේ පරිණතභාවය, භාවිතාව හැකියාව සමග ඍජු සම්බන්ධයක් නොතිබිය හැකිය.

2. වඩා හොඳ සන්නිවේදනය සඳහා හොඳින් ප්‍රගුණ කළ ඉංග්‍රීසි භාවිත හැකියාව තිබිය යුතුය.

3. භාවිතාව ඉංග්‍රීසි කතාකිරීම, ලිවීම, ඇසීම, කියවීම සිදු වන වටපිටාව/අවස්ථාව සමග ඍජු සම්බන්ධයක් ඇත.

උදාහරණයක් ලෙස ඔබ වෙළඳසැලකින් භාණ්ඩයක් මිලදී ගැනීම සහ රෝහල තුළදී වෛද්‍යවරයකු සමග කතා කිරීම යන අවස්ථා දෙකම එකිනෙකට සහ මුලින්ම වෙනස් වූ ඉංග්‍රීසි හැකියාවන් උපයෝගී කරගනු ලැබේ.

OET විභාගය හා ඒ ආශ්‍රිත ඉගැන්වීම පුහුණු කිරීම ඉහත දැක්වූ රෝහල්/සෞඛ්‍ය වෛද්‍ය වටපිටාවක දී ඔබ විසින් අනිවාර්යෙන්ම දැනගත යුතු භාවිතාකළ යුතු හා විද්‍යාමානකළ යුතු කුසලතාවය ඉගැන්වේ. මේ වන විට එක්සත් රාජධානිය, ඇමරිකාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, එක්සත් අරාබි එමිර් රාජ්‍යය, දකුණු අප්‍රිකාව ආදී බොහෝ රටවල සෞඛ්‍ය වෛද්‍ය හෙද මණ්ඩල සහ රාජ්‍ය ආයතන බොහෝ ගනනක් පිළිගත් සම්මතය OET ඇගයීම බවට සනාථ වී ඇත.




මෙම කරුණු අරභයා අපගේ නිර්දේශය වන්නේද වෛද්‍ය හෙද හෙදි සහ සෙසු සෞඛ්‍ය සේවා නිලධාරීන් විසින් OET විභාගය වඩා නිවැරදි තේරීම ලෙස සැලකිය යුතු බවයි.

එමගින් ඔබගේ වෘත්තීයට අදාල ඉංග්‍රීසි හැකියාව ඍජු ලෙසම වර්ධනය කරගත හැකි අතර සංක්‍රමණික ප්‍රවේශයන් සඳහා වඩා ඉක්මනින් යොමු විය හැක. ලොව පිළිගත් එක්සත් රාජධානියේ ඕස්ට්‍රේලියාවේ හා ඉන්දියාවේ ගුරුවරුන් විසින් මෙහෙයවන අපගේ OET පාඨමාලා මාසයක්, මාස හතරක් හෝ මාස හයක් ඇතුළත සම්පූර්ණ කොට බොහෝ රටවල සංක්‍රමණ වරම් උදාකර ගන්න.

**නව සේවාවක්**



## රැකියා නියෝජිත ආයතන සඳහා IELTS

ඔබ රැකියා නියෝජිත ආයතනයක් නම්,  ශ්‍රී ලංකිකයන් හට විදේශ රටවල රැකියා අවස්ථා  උදා කරදේනම්, මෙම පණිවුඩය ඔබටයි.
විවිධ ක්ෂේත්‍ර වලට සම්බන්දව යුරෝපා රටවල රැකියා ලබා ගැනීමට බලාපොරොත්තු වන්නන් සඳහා අප විසින් විශේෂ පුහුණු පාඨමාලා බොහොමයක් නුදුරු දිනයන්හි හඳුන්වා දීමට බලාපොරොත්තු වන්නෙමු.
සෞඛ්‍ය/සමාජ සත්කාර (Caregiver), හෝටල් සේවකයන්, ජල නල ශිල්පීන්, විදුලි කාර්මික ශිල්පීන් වැනි අංශ බොහොමයක් සඳහා අදාල ඉංග්‍රීසි ඉගැන්වීම් අවස්ථා උදා කොට විශ්වාසය පෙරදැරිව ඔවුන් රට රට වල ස්ථානගත කිරීමට අවස්ථාව ලඟාකර ගන්න.








එක්සත් රාජධානිය වෙත විකල්ප සංක්‍රමණික මාර්ග දැනුවත් කිරීමේ සැසිය ජූනි මස අග සාර්ථකව නිම කරන ලදී. අධ්‍යාපනික සංක්‍රමණික කටයුතු සඳහා මනා පළපුරුද්දක් ඇති ජේරම් ඩයස් අභයගුණවර්ධන මහතා විසින් මෙහෙයවන ලැබූ මෙම රැස්වීම් අවස්ථාවන්හි සටහන් කිහිපයක් ඉහත දැක්වේ.

හෙද ක්ෂේත්‍රයට පරිබාහිරව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නියුතු වන්නන්ට එකසත් රාජධානියේ බොහෝ වෘත්තීය වරම් ඇති බව ඔබ දන්නවාද?
එවැනි වරම් අපේක්ශිතව සංක්‍රමණය කිරීමට බලාපොරොත්තු වනවාද?
නුදුරු අනාගතයේම හෙද හෙදි සහ සෙසු සෞඛ්‍ය වෘත්තිකයන්ට එකසත් රාජධානිය, අයර්ලන්තය, ඇතුලු තවත් රටවල් කිහිපයක ඇති වෘත්තීය වරම් ගැන ඔබ දැනුවත් කිරීමට අප බලාපොරොත්තු වන්නෙමු.

# අපගේ නව ආයතන පරිශ්‍රය











අංක 31, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02 හි පිහිටි අපගේ ආයතන දැන් වඩාත් පුළුල් සේවාවන් ලබා දීම සඳහා කැපව සිටී.

පංති කාමර, රැස්වීම් කාමර, එළිමහන් භූමිය ඉගෙන්වීමේ සහ පුහුණු කටයුතු සඳහා හොඳ වාතාවරණයක් ලබාදේ.

ඔබ හට අප ආයතනය සමඟ සම්බන්ධ විය හැකි ක්‍රම:

- පහත දක්වා ඇති දුරකතන, වට්ස්ඇප්, ඊමෙල් සහ වෙබ් ප්‍රවේශය ඔස්සේ කලින් වෙන් කරවාගත් දිනයක්, කාලයක් තුල Online හමුවක් මගින්
- සෑම සිකුරාදා දිනයකම අප කාර්යාලයට පෞද්ගලිකව පැමිණ මුණගැසීම
- ඔබ යම්කිසි කාර්යාලයක මානව සම්පත් පුහුණු කළමණාකරන නිලධාරියෙකු නම් අප ආයතනයේ සේවාවන් සාකච්ඡා කිරීමට රැස්වීම් කාල සීමා වෙන්කරවා ගැනීම තුලින්
- අප ආයතනය විසින් ඔබ ආයතනයේ පිරිස් සදහා කරන ඉදිරිපත් කිරීම් (Presentations) තුලින්
- ඔබ හෙද හෙදි පුහුණු ආයතනයක් නම් අප විසින් කරනු ලබන වැඩසටහන් පිලිබද දේශන, කුඩා පිරිස් රැස්වීම්, වැඩමුළු, හා දේශන මාලා ඔස්සේ
- අධ්‍යාපන කටයුතු, සමාජ සත්කාර (Caregiver) වරම් ආදී මාතෘකා ඔස්සේ පවත්වනු ලබන විශේෂ දේශන මාලා හා සම්මුඛ සාකච්චා ඔස්සේ
- අපගේ Youtube නාලිකාව ඔස්සේ/Facebook ජාලය ඔස්සේ එවනු ලබන පණිවිඩ මගින්

තවත් මුල්පිරිමක් ඔස්සේ ඔබ අතරට පැමිණීමට සූදානම් බව ඉමහත් සාඩම්බරයෙන් ඔබ වෙත ප්‍රකාශ කරන්නෙමු. අපගේ **Youtube** නාලිකාව මේ මොහොතේ, ඉතාමත් සතුටින් ඔබ වෙත හදුන්වා දෙන්නෙමු.

සන්නිවේදන ප්‍රවණතාවයන් හා ගලපා තොරතුරු ලබා දීමට මෙම මාධ්‍ය ඉතා වඩාත්ම ඵලදායි වනු ඇතැයි අපි විශ්වාස කරන අතර, එබැවින් "**Healthcare Immigration Academy**" Youtube නාලිකාව දියත් කිරීම පිලිබඳව අප මහත් සතුටට පත් වන්නෙමු.

ඉංග්‍රීසි, සිංහල සහ දෙමල යන භාෂා තුනෙන්ම වීඩියෝ සහ ඔබට අවශ්‍ය තොරතුරු සමඟ ඔබ වෙත පිවිසීමට අප සූදානම්.

## ඉදිරි මස කලාපයෙන්

- හෙද හෙදි සිසු සිසුවියන් සඳහා විශේෂ අධ්‍යාපන වරම්, සමාජ සත්කාර/සෞඛ්‍ය සත්කාර (**Caregiver**) වරම්
- එංගලන්තයේ **Caregiver** ක්ෂේත්‍රයේ පවතින වාතාවරණය
- අප සමඟින් **UK-Ready Nurse** සහ **OET** පුහුණුව හදාරන්නන්ගෙ ප්‍රගති සමාලෝචනයක්
- රට පුරා "සැමට ඉංග්‍රීසි" යන තේමාව ඔස්සේ පවත්වන හැදින්වීම් ඉදිරිපත් කිරීම් සහ පුහුණු කටයුතුද ඒ සම්බන්ධයෙන් ඔබට සම්බන්ද විය හැකි ආකරය පිලිබඳ තොරතුරු වැනි බොහෝ අංග ඔස්සේ ඔබ වෙත නවතම කරුණු රාශියක් ගෙන ඒමට බලාපොරොත්තු වන්නෙමු.

මූලාශ්‍ර
www.gov.uk
www.nmc.org.uk
www.hcpc-uk.org
www.gmc-uk.org
www.oet.com
www.ielts.org

**International Immigration Consulting & Legal Services (Private) Limited**
No. 31, W.A.D. Ramanayake Mawatha,Colombo 00200, Sri Lanka
Tel: +94-117 550067 / +94-117 550068
Mobile / WhatsApp: +94-761518933
Email: help@hia.lk
Website: www.hia.lk
Facebook: www.facebook.com/Healthcare-Immigration-Academy-102458585824673/